වව්නියාවේ තෝනික්කල් ප්‍රදේශයේ උපන් දින සාදයක් පැවති නිවසකට, ජූලි 23, 2023 දින අලුයම; කඩාවැදුණු නාඳුනන පිරිසක්, නිවසේ සිටි අයට පහරදී නිවසටද ගිනි තැබීම නිසා, එක් කාන්තාවක් මියගොස් තවත් 10 දෙනකු තුවාල ලබා ඇති බව, පොලිසිය උපුටා දක්වමින්, මාධ්‍ය වාතර්ා කර තිබිණි. මෙම පුවත වාතර්ා කිරීමේදී, මියගිය කාන්තාවගේ ඡායාරූපයක් ද, සිරස්තල සමඟින් ඇතැම් මාධ්‍ය ඉදිරිපත් කර තිබිණි.

එසේම, මෙම පුවත වාතර්ා කරන මව්බිම පුවත සමග, මියගිය කාන්තාවගේ ඡායාරූපයට අමතරව, මුහුණ වසා ගත් මැර කණ්ඩායමක් නිරූපණය වන ඡායාරූපයක් ද පළකර තිබිණි.

1) මියගිය කාන්තාවකගේ ඡායාරූපයක් මේ අයුරින් පළ කිරීම, මෙම සිදුවීමට හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) වණර්යක් ලබා දෙන්නේ යැයි ඔබ සිතන්නේද?

2) මියගිය කාන්තාවගේ ඡායාරූපය රහිතව මෙම පුවත වාතර්ා කිරීමෙන්, පුවතට හානියක් සිදුවේ යැයි ඔබ සිතන්නේද?

3) එසේ හානියක් සිදු නොවේ යැයි ඔබ සිතන්නේ නම්, මිය ගිය කාන්තාවගේ ඡායාරූපය පුවතට අවශ්‍ය වන්නේද?

4) මියගිය කාන්තාවගේ මෙම ඡායාරූපය පුවත සමග පළ කිරීමට, ඇගේ පවුලේ අයගේ අනුමැතිය ලබාගෙන තිබේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!